# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශ පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ජූලි මස 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශ පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 09 වන දින]

එල්.ඩී.—ඕ.85/71.

අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයෙන් තීරණය කෙරෙන යම් විදේශීය වරායයන්ට ශ්‍රී ලංකාවේ සිට නැව් ඉඩ පහසුකම් වෙන්කිරීම මධ්‍යගත කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශය පිහිටුවීම සඳහා ද ලංකා නැව්ගතකරන්නන්ගේ මණ්ඩලයේ අනුග්‍රහයෙන් පිහිටුවන ලද ලංකා නැව් ඉඩපහසුකම් කාර්යාංශයේ කටයුතු අවසන් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, කාර්යාංශයේ බලතල හා කාර්ය විධිමත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කෙරෙන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක දී ක්‍රියාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

**2.** (1) (මෙහි මින් මතු "කාර්යාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශය නමින් හැඳින්වෙන කාර්යාංශයක් පිහිටුවනු ලැබේ.

(2) කාර්යාංශය, (1) වන උපවගන්තිය මගින් එයට දී ඇති නමින් සංස්ථාපිත මණ්ඩලයක් වන අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් ද පොදු මුද්‍රාවක් ද ඇත්තේ ය. එකී නාමයෙන් නඩු පැවරීමත් නඩු පවරනු ලැබීමත් කළ හැකි ය.

ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශය පිහිටුවීම.

**3.** කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ කාර්යාංශයේ සාමාජිකයෝ වන්නාහ.

කාර්යාංශයේ සාමාජිකයෝ.

**4.** (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන හත් දෙනකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවකින් යුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් කාර්යාංශයට තිබිය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලය.

(2) යම් තැනැත්තෙක් ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයෙක් නම් ඔහු අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

(3) සෑම අධ්‍යක්ෂවරයකු ම, කලින් ඉල්ලා අස්වුවහොත්, මිය ගිය හොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස අවුරුදු තුනක් ධුරය දැරිය යුතු ය.

(4) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් අධ්‍යක්ෂවරයකුට ඉල්ලා අස්විය හැකි ය.

(5) ඉල්ලා අස්වීමෙන් හෝ ධුර කාලය ඉකුත්වීමෙන් හෝ කම ධුරය හිස් කරන අධ්‍යක්ෂවරයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

2—කේ 21831—10407 (73/7)

(6) ඕනෑම අධ්‍යක්ෂවරයකු හේතුවක් නො දක්වා ධුරයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට හැකි වන අතර එබඳු ඉවත් කිරීමක් ගැන, අභියාචනයක් මගින් හෝ රිට් ආඥාවක් මගින් හෝ අන් කවර ආකාරය කින් හෝ කිසිම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(7) (අ) සිය ධුර කාලය අවසන්වීම හැර වෙනත් යම් හේතුවක් නිසා යම් අධ්‍යක්ෂවරයකු සිය ධුරයෙන් ඉවත්ව ගියහොත් අමාත්‍යවරයා විසින්, එසේ ධුරයෙන් ඉවත්ව ගිය අධ්‍යක්ෂවරයා වෙනුවට වෙන යම් තැනැත්තකු අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කළ හැකි ය.

(ආ) මෙම උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද යම් අධ්‍යක්ෂවරයකු කලින් ධුරයෙන් ඉවත්ව ගියහොත් මිස, තමා අනුප්‍රාප්ත වූ අධ්‍යක්ෂවරයාගේ ඉතිරි ධුර කාලසීමාව තුළ ඔහු ධුරය දැරිය යුතු ය.

(8) රෝගාතුරවීම නිසා හෝ වෙනත් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ අධ්‍යක්ෂවරයකුට තම ධුරයෙහි කාර්යයන් ඉටු කිරීම තාවකාලික ව නො හැකි වන කල්හි එසේ කාර්ය ඉටු කිරීමට නො හැකිව සිටින හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටින හෝ කාලසීමාව තුළ දී ඔහු වෙනුවට ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය.

කාර්යාංශයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

5. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ගෙවීම් ප්‍රමාණයන් අනුව කාර්යාංශයේ අරමුදල්වලින් සියලුම අධ්‍යක්ෂවරුන්ට හෝ යම් අධ්‍යක්ෂවරයකුට හෝ පාරිශ්‍රමික ගෙවිය හැකි ය.

කාර්යාංශය විසින් ඇති කිරීමට යෝජනා කරනු ලබන ගිවිසුම් පිළිබඳ ව සම්බන්ධතාවක් ඇති කාර්යාංශයේ සාමාජිකයන් විසින් එය එළිදරව් කළ යුතු බව.

6. කාර්යාංශය විසින් ඇති කරන ලද්ද වූ හෝ ඇති කිරීමට යෝජනා කරන ලද්ද වූ හෝ ගිවිසුමක් පිළිබඳ ව කෙලින් ම හෝ අන් අයුරකින් කවර වූ හෝ ආකාරයක සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී ස්වකීය සම්බන්ධතාවේ ස්වභාවය එළිදරව් කළ යුතු ය. එම එළිදරව් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් වාර්තාවල සටහන් කරනු ලැබිය යුතු අතර එම ගිවිසුම සම්බන්ධයෙන් එම අධ්‍යක්ෂ මණ්ඩලය කරන සාකච්ඡාවකට හෝ තීරණයකට හෝ එකී අධ්‍යක්ෂවරයා සහභාගි නොවිය යුතු ය :

එසේ වුව ද කාර්යාංශයේ යම් අධ්‍යක්ෂවරයකුට තමන් රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු වීමේ හේතුවෙන් ගිවිසුමක් පිළිබඳ ව ඇති සම්බන්ධතාව මේ වගන්තියේ අර්ථානුකූල සම්බන්ධතාවක් නොවන ලෙසට සලකනු ලබන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල ගණපූරණය සහ කාර්ය පරිපාටිය විධිමත් කිරීම.

7. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය තුන් දෙනකු විය යුතු අතර මේ පනතේ විධිවිධානවලට යටත් ව, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් හා එකී රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ තමන්ගේ ම කාර්ය පරිපාටිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත් කළ හැකි ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියා වල හා කෘත්‍යවල වලංගු භාවය.

8. අධ්‍යක්ෂවරයන් අතර පුරප්පාඩුවක් තිබීම හෝ අධ්‍යක්ෂ මණ්ඩල යට යම් අධ්‍යක්ෂවරයකු පත්කිරීමෙහි ලා දෝෂයක් තිබීම පමණකින් ම අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් අවලංගු ලෙස සලකනු නො ලැබිය යුතු ය.

9. කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි කටයුතු පරිපාලනය කළ යුතු ය ; බලතල ක්‍රියාත්මක කළ හැකි ය ; කාර්යාංශයේ කාර්යයන් ඉටු කළ යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් විසින් කාර්යාංශයේ කටයුතු පරිපාලනය කළ යුතු බව.

10. (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල සහ කාර්යයන්ගෙන් යමක් කාර්යාංශයේ සභාපතිට, අධ්‍යක්ෂවරයකුට හෝ සේවකයකුට හෝ පැවරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළ හැකි ය.

මණ්ඩලයේ බලතල සහ කාර්යයන් අන් කෙනකුට පැවරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ බලයක් හෝ කාර්යයක් පවරනු ලැබූ සෑම තැනැත්තකු ම විසින් එම බලය හෝ කාර්ය අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ හෝ විධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉෂ්ට කිරීම හෝ කළ යුතු ය.

11. (1) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයන් අතුරින් කෙනකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති.

(2) රෝගාතුරවීම නිසා හෝ වෙනත් දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිට තාවකාලික වශයෙන් සිය ධුරයේ කාර්යයන් ඉටුකළ නොහැකි වේ නම් ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට අධ්‍යක්ෂවරයන්ගෙන් කෙනකු අමාත්‍ය වරයා විසින් පත් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත්කළ සභාපති පැමිණ සිටී නම් ඔහු විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීමට නියමිත වේලාවේ සභාපති පැමිණ නො සිටියි නම් පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින් ඔවුන් අතරින් කෙනකු එහි මූලාසනය දැරීම සඳහා තෝරාගත යුතු ය.

(4) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක මාර්ගයෙන් සභාපතිට ඉල්ලා අස්විය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින් හේතුවක් නො දක්වා සභාපතිගේ පත්වීම අවසන් කළ හැකි අතර, එසේ පත්වීම අවසන් කිරීම අභියාචනයක් මගින් හෝ රිට් ආඥවක් මගින් හෝ අන් කවර ආකාරයකින් හෝ කිසි ම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ ප්‍රශ්න නො කළ යුතු ය.

(6) (4) සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිගේ ධුර කාලය අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුර කාලය වන්නේ ය.

(7) අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමක සභාපතිවරයාට සිය ඡන්දයට අතිරේක ව තීරණ ඡන්දයක් ඇත්තේ ය.

12. (1) කාර්යාංශයේ මුද්‍රාව අධ්‍යක්ෂ මණ්ඩලය භාරයේ හෝ ඒ සඳහා එකී මණ්ඩලය විසින් බලය පවරන ලද කාර්යාංශයේ යම් නිලධරයකු භාරයේ හෝ තිබිය යුතු ය.

කාර්යාංශයේ මුද්‍රාව.

(2) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකින් කාර්යාංශයෙහි මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, කාර්යාංශයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ නො තැබිය යුතු ය. ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් එම සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය. අධ්‍යක්ෂවරයන් දෙදෙනකු නොමැති අවස්ථාවක දී එක් අධ්‍යක්ෂවරයකු සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ නිලධරයකු එසේ අත්සන් කළ යුතු ය.

**කාර්යාංශය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.**

**13.** (1) අමාත්‍යවරයා විසින්, කාර්යාංශයේ කාර්ය ඉටුකිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ලිඛිත විධාන අධ්‍යක්ෂ මණ්ඩලයට නිකුත් කළ හැකි අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකී විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) කාර්යාංශයේ දේපළ සහ ව්‍යාපාර කටයුතු පිළිබඳ වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු තමා විසින් නියම කළ හැකි ආකාරයෙන් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලියවිල්ලකින් විධාන කළ හැකි අතර, ඒ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එබඳු සෑම විධානයක් ම ක්‍රියාත්මක කළ යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් කාර්යාංශයේ සියලුම කටයුතු හෝ ඉන් යම් කට යුත්තක් හෝ විමර්ශනය කොට ඒ පිළිබඳ ව තමා වෙත වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල නියම කළ හැකි අතර, එබඳු නියමයක් කරනු ලැබූ විට එම නියමය ක්‍රියාත්මක කිරීම සඳහා එකී තැනැත්තාට හෝ තැනැත්තන්ට අවශ්‍ය වන සියලු පහසුකම් සැලසීමත් සියලු තොරතුරු සැපයීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළ යුතු ය.

**කාර්යාංශයේ පරමාර්ථ.**

**14.** කාර්යාංශයේ පරමාර්ථ පහත සඳහන් පරිදි වන්නේ ය :—

(අ) ශ්‍රී ලංකාවේ යම් වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ගමනාන්තය කට නැව්ගත කළ යුතු කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් යම් මුහුදු යාත්‍රාවක නැව් බඩු සඳහා ඉඩපහසුකම් වෙන් කිරීම පිණිස නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාලයක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම ;

(ආ) ශ්‍රී ලංකාවේ වරායවලට පැමිණෙන මුහුදු යාත්‍රාවලට උපරිම බඩු තොග ලැබෙන බවට වගබලාගැනීමේ අදහසින් ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත යම් ගමනාන්තයකට නැව්ගත කළ යුතු කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය සමූහනය කිරීමට සැලැස්වීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ගමනාන්ත යකට නැව්ගත කළ යුතු කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම පිණිස නැව් පැමිණෙන වාර ගණන සහ නැව් ලබාගත හැකිවීම මනා ලෙස සංවිධානය කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත යම් ගමනාන්තයකට නැව්ගත කළ යුතු කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා කටයුතු සැලැස්වීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ගමනාන්තය කට බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය නැව්ගත කිරීම සඳහා කාර්යක්ෂම හා නිත්‍ය සේවාවන් තිබීම ගැන වගබලා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම ;

(ඊ) ජාතික වෙළෙඳ නැව් සේවාව සංවර්ධනය කිරීමෙහි නියැලීම ;

(උ) ශ්‍රී ලංකාවේ වරායවල ක්‍රියාකාරිත්වය, පැටවුම් වේගය, නැව් බඩු මෙහෙයවීම හා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් කටයුතු දියුණු කිරීම ;

(ඌ) නැව් ගාස්තු ප්‍රමාණ, අධිභාර, නැව් සේවයන්හි ප්‍රමාණවත් භාවය, පැමිණීමේ වාර ගණන හා කාර්යක්ෂමතාවය සහ ඊට ආනුෂංගික කරුණු පිළිබඳව නැව් හිමියන් සහ නැව් සමාගම් සමග තනි තනිව හෝ සාමූහිකව හෝ සාකච්ඡා කිරීම ;

(එ) කාර්යාංශය විසින් ම හෝ නැව්ගතකරන්නන් වෙනුවෙන්, තනි තනිව හෝ සාමූහිකව හෝ නැව් හිමියන් හෝ නැව් සමාගම් සමග ගිවිසුම්වලට ඇතුළු වී, ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ගමනාන්තයකට නැව්ගත කරනු ලබන කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය ගෙනයෑම සඳහා කටයුතු සැලැස්වීම ;

(ඒ) නැව්ගතකරන්නන්ට දරන්නට සිදුවන වියදම් අඩු කිරීම ;

(ඔ) ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ගමනාන්තය කට නැව්ගත කරනු ලබන කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය ගෙනයාම සඳහා වඩාත් ම වාසිදයක නැව් ගාස්තු ප්‍රමාණයන් හා නියම ලබා ගැනීම ;

(ඕ) නැව් කටයුතු හා නැව් ගාස්තු ප්‍රමාණයන් පිළිබඳ ව පර්යේෂණ කටයුතු භාරගැනීම ; සහ

(ක) මෙහි මින් පෙර සඳහන් කරන ලද පරමාර්ථ ඉටුකර ගැනීමට අවශ්‍ය වන හෝ ඊට ආනුෂංගික වන හෝ වෙනත් සියලු ක්‍රියා හෝ දේවල් කිරීම.

**15.** (1) කාර්යාංශයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර හෝ ආනුෂංගික වන හෝ ඕනෑම දෙයක් කිරීමට කාර්යාංශ යට බලය ඇත්තේ ය. කාර්යාංශයේ සාමාන්‍ය බල

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත සඳහන් දේ කිරීමට කාර්යාංශයට බලය ඇත්තේ ය :—

(අ) ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත යම් ගමනාන්තයකට නැව්ගත කරනු ලබන කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ කාර්යය මධ්‍යගත කිරීම ;

(ආ) වෙළෙඳාම හා නැව් කටයුතු සම්බන්ධයෙන් ජාතික උන්නතිය ආරක්ෂා කෙරෙන හා වර්ධනය වන අයුරින් මුහුදු යාත්‍රාවලට නැව් බඩු වෙන් කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත යම් ගමනාන්තයකට නැව්ගත කරනු ලබන කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය කවර යාත්‍රාවලින් ගෙනයායුතු දැයි නිශ්චය කිරීම ;

(ඈ) නැව් ගාස්තු ප්‍රමාණ, අධිභාර, නැව් සේවාවල ප්‍රමාණවත් බව, පැමිණීමේ වාර ගණන හා කාර්යක්ෂමතාව සහ ඊට ආනුෂංගික කරුණු පිළිබඳ ව නැව් හිමියන් සහ නැව් සමාගම් සමඟ තනි තනිව හෝ සාමූහිකව හෝ සාකච්ඡා කිරීම ;

(ඉ) කාර්යාංශය විසින් ම හෝ නැව්ගතකරන්නන් වෙනුවෙන්, තනි තනිව හෝ සාමූහිකව හෝ නැව් හිමියන් හෝ නැව් සමාගම් සමග ගිවිසුම්වලට ඇතුළු වී, ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ගමනාන්තයකට නැව්ගත කරනු ලබන කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් සියලු බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය ගෙනයෑම සඳහා කටයුතු සැලැස්වීම ;

(ඊ) කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ වරායවලින් නැව්ගත කිරීම පහසු කරනු සඳහා අවශ්‍ය වන ගොඩනැඟිලි උපකරණ ආදිය හා පහසුකම් වරාය කොමසාරිස්වරයාගේ පූර්ව අනුමතිය ඇතිව; එම වරායවල ඉදිකිරීම, සැලැස්වීම, ඉටුකිරීම, ස්ථාපනය කිරීම, දියුණු කිරීම, ක්‍රියා කරවීම, සංවර්ධනය කිරීම, පරිපාලනය කිරීම, පාලනය කිරීම හෝ මෙහෙයවීම ;

(උ) වරාය (නැව් බඩු) සංස්ථාවේ අනුමතිය ඇතිව, කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් සියලු බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය ගුදම්ගත කිරීමේ, වාප්පුගත කිරීමේ හා නැව්ගත කිරීමේ සේවා පිළියෙල කිරීම හෝ ඒ සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඌ) ශ්‍රී ලංකාවේ ඕනෑම වරායකින් නැව්ගත කිරීම සඳහා කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම හා ගුදම්ගත කිරීම ;

(එ) බඩු නැව්ගතකරන්නන්, නැව් නියෝජිතයන් හා නැව් හිමියන්ට කාර්යාංශය මඟින් සලස්වනු ලබන නැව් ඉඩපහසුකම් වෙන් කරවා ගැනීම, වෙන්කර තැබීම හා වෙන්කර දීම ඇතුළු යම් සේවා හෝ පහසුකම් සඳහා ගාස්තු සහ කොමිස් මුදල් අය කිරීම ;

(ඒ) කවර පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් සියලු බඩු, නිෂ්පාදන හා වෙළෙඳ ද්‍රව්‍ය ශ්‍රී ලංකාවෙන් ගෙන යාමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම ;

(ඔ) නිශ්චල හෝ චංචල දේපළ කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම හා සතුව සිටීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම ;

(ඕ) කාර්යාංශයේ වැඩ කරගෙන යාමට අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම සඳහා කාර්යාංශය විසින් සපයනු ලබන පහසුකම් හා අන්‍යයන් විසින් සපයනු ලබන සහාය හා පහසුකම් ඇතුළු ව කාර්යාංශය මගින් සේවයෙහි යොදවනු ලැබ සිටින තැනැත්තන්ගේ දක්ෂතාව හෝ එහි උපකරණවල කාර්යක්ෂමතාව හෝ එම උපකරණ ක්‍රියාකරවන ආකාරය හෝ දියුණු කිරීමට අවශ්‍ය වන ඕනෑම දෙයක් කිරීම ;

(ක) කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ එහි පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම් හෝ එකඟවීම් කෙළින්ම හෝ අන් අයුරකින් කාර්යාංශයේ නිලධරයකු හෝ නියෝජිතයකු මගින් ඇති කොට ක්‍රියාත්මක කිරීම ;

(ග) අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව කාර්යාංශය නිශ්චය කරන අයුරකින් සහ ඇපයක් පිට එහි කාර්යයන් සඳහා කවර හෝ මාර්ගයකින් මුදල් ණයට ගැනීම ;

(ච) කාර්යාංශයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා මුදල් ලබා ගැනීම හා වියදම් කිරීම ;

(ජ) එහි නිලධරයන්, සේවකයන් හා නියෝජිතයන් පත් කිරීම, සේවයේ යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම හා ඔවුන් පාලනය කිරීම සහ එහි කටයුතු පරිපාලනය කිරීමට අදාළ සියලු කරුණු විධානය කිරීම හා තීරණය කිරීම ;

(ට) කාර්යාංශය විසින් සේවයට යොදවනු ලැබ සිටින හෝ කාර්යාංශයට සේවය කරන තැනැත්තන් සඳහා ශුභසාධක හා විනෝද ක්‍රීඩා පහසුකම්, නිවාස, නේවාසිකාගාර හා එවැනි වෙනත් ඉඩපහසුකම් සැපයීම ;

(ඩ) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා රීති සෑදීම ;

(ත) කාර්යාංශයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා ක්‍රම සම්පාදනය කිරීම.

*නැව් ඉඩපහසුකම් වෙන්කරවා ගැනීමේ පරම අයිතිය.*

**16.** (1) අමාත්‍යවරයා විසින්, කලින් කල ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, එකී නියමයෙහි නියම කරනු ලබන දිනක සිට, එකී නියමයෙහි දක්වනු ලබන බඩු නොවන වෙනත් බඩු ශ්‍රී ලංකාවෙහි ඕනෑම වරායක සිට එකී නියමයෙහි දක්වනු ලබන ගමනාන්තයක් කරා ගෙනයාම සඳහා නැව් ඉඩපහසුකම් හෝ මුහුදු යාත්‍රාවක නැව් බඩු සඳහා ඉඩපහසුකම් වෙන්කරවා ගැනීමේ, වෙන්කර තැබීමේ හෝ වෙන් කරදීමේ පරම අයිතිය කාර්යාංශය සතු කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගමනාන්තයකට බඩු ගෙනයාම සඳහා නැව් ඉඩපහසුකම් හෝ නැව් බඩු ඉඩපහසුකම් වෙන්කරවා ගැනීමේ හෝ වෙන්කර තැබීමේ පරම අයිතිය කාර්යාංශය වෙත පවරනු ලැබූ දින හා එදිනට පසුව—

(අ) එකී බඩු එකී ගමනාන්තය කරා ගෙනයාම සඳහා කාර්යාංශය හැර අන් තැනැත්තකු විසින් නැව්හිමියකු හෝ ඔහුගේ නියෝජිතයා සමඟ නැව් ඉඩපහසුකම් හෝ නැව් බඩු ඉඩපහසු කම් වෙන්කරවා ගැනීම හෝ වෙන්කර තැබීම නොකළ යුතු ය ;

(ආ) එකී බඩු ගෙනයාම සඳහා කාර්යාංශය විසින් නැව් ඉඩපහසුකම් හෝ නැව් බඩු සඳහා ඉඩපහසුකම් වෙන්කරවා ගෙන, වෙන් කර තබා හෝ වෙන්කර දී ඇතොත් මිස, කිසිම තැනැත්තකු විසින් එකී නැව් බඩු එකී ගමනාන්තය දක්වා කිසිම මුහුදු යාත්‍රාවකින් නැව්ගත නොකළ යුතු ය ; තවද

(ඇ) මේ උපවගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කඩ කරමින් එකී බඩු එකී ගමනාන්තය කරා ගෙන යාම සඳහා නැව් ඉඩපහසුකම් හෝ නැව් බඩු ඉඩපහසුකම් වෙන්කරවා ගැනීම, වෙන්කර තැබීම හෝ වෙන්කර දීම සහ එකී බඩු ගෙනයාම සම්බන්ධ යෙන් නැව්ගතකරන්නකු සහ මුහුදු යාත්‍රාවක අයිතිකරුවකු, නියෝජිතයකු හෝ නියමුවකු අතර ඇති කරගන්නා යම් නැව් කුලී ගිවිසුමක් සියලු කාර්යයන් සඳහා ශූන්‍ය හා බලරහිත ලෙසත් එහි කිසිම බලයක් හෝ වලංගුතාවයක් නොමැති ලෙසත් සලකනු ලැබිය යුතු ය.

ශූන්‍ය හා බලරහිත වන ඇතැම් සම්මුති හා එකඟවීම්.

**17.** 16 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් බඩු ගමනාන්තයක් කරා ගෙන යාම සඳහා නැව් ඉඩපහසුකම් හෝ නැව් බඩු සඳහා ඉඩපහසුකම් වෙන් කරවා ගැනීමේ හෝ වෙන්කර තැබීමේ පරම අයිතිය කාර්යාංශය සතු කරනු ලැබූ දින හා එදිනට පසුව කිසිම නැව්ගතකරන්නකු විසින් ශ්‍රී ලංකාවේ වරායක සිට එකී ගමනාන්තයක් කරා එකී බඩු නැව්ගතකරන්නකු තමාගේම ගිණුමට හෝ තම සාංගමික යන්ගේ හෝ ප්‍රධානයන්ගේ ගිණුම සඳහා, ශ්‍රී ලංකාවේ සිට එකී බඩු, එකී නැව් හිමියා හෝ නැව් සමාගම විසින් සපයනු ලබන මුහුදු යාත්‍රාවකට පමණක් සීමා කිරීමට ප්‍රතිදානයක්, වට්ටමක් හෝ අන් ආකාරයක යම් මුදලක් එකී බඩු නැව්ගතකරන්නාට ගෙවීමට එම නැව් හිමියා හෝ නැව් සමාගම එකඟවීමෙන් හෝ " ගිවිසුම් ගාස්තු ප්‍රමාණයක් " මත හෝ භාරගන්නා සම්මුතියක් හෝ එකඟවීමක් නැව් හිමියකු හෝ නැව් සමා ගමක් සමඟ තනි තනිව හෝ සාමූහිකව හෝ ඇතිකර නොගත යුතු අතර, එකී දිනට පෙරාතුව ම වූ දිනයෙහි පැවති හෝ ඉන් පසු ඕනෑම දිනක ඇතිකර ගන්නා ලද හෝ එබඳු යම් සම්මුතියක් හෝ එකඟවීමක් සියලු කාර්යයන් සඳහා ශූන්‍ය හා බලරහිත හා නීත්‍යනුකූලව එහි කිසිම බලයක් හෝ බලපෑමක් නොමැති ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත දැක් වූ විධිවිධාන, කාර්යාංශය විසින් එවැනි නැව්ගතකරන්නකු සඳහා හෝ වෙනුවෙන් එවැනි සම්මුතියක් හෝ එකඟවීමක් හෝ ඇතිකර ගැනීම කෙරෙහි බල නොපාන්නේ ය.

**කාර්යාංශය විසින් අය කරනු ලබන ගාස්තු.**

**18.** (1) කාර්යාංශය විසින් බඩු නැව්ගතකරන්නන්ට, අපනයන කරුවන්ට, නැව් නියෝජිතයන්ට සහ නැව් හිමියන්ට ඉටු කරනු ලබන නැව් ඉඩපහසුකම් හෝ නැව් බඩු සඳහා ඉඩපහසුකම් වෙන් කරවා ගැනීම, වෙන්කර තැබීම හා වෙන්කර දීම ඇතුළු සේවාවන් හෝ සලසනු ලබන පහසුකම් වෙනුවෙන් කාර්යාංශය විසින් අය කළ හැකි ගාස්තු හා කොමිස් මුදල් එකී කාර්යාංශය විසින් අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව නියම කළ යුතු අතර එවැනිම අනුමතිය ඇතිව ඒවා ප්‍රතිශෝධනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් ගාස්තු හා කොමිස් මුදල්, කාර්යාංශය විසින් ඉල්ලා සිටිනු ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ගාස්තුවක් හෝ කොමිස් මුදලක් වශයෙන් යම් මුදලක් ඉල්ලා සිටිනු ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත එකී මුදල කාර්යාංශයට ගෙවීම නැව්ගතකරන්නකු, අපනයනකරුවකු, නැව් නියෝජිතයකු හෝ නැව් හිමියකු විසින් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී එකී මුදල, එකී නැව්ගතකරන්නාගේ, අපනයනකරුගේ, නැව් නියෝජිතයාගේ හෝ නැව් අයිතිකරුගේ අන්තිමට දන්න සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත කාර්යාංශය විසින් ඉල්ලුම් කරනු ලැබීමෙන් පසු, එකී මුදල එකී අධිකරණය විසින් සිය සාමාන්‍ය අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලබන දඩ මුදලකට වැඩි වුව ද එය නොතකා, එකී අධිකරණය විසින් පනවන දඩයක ආකාරයෙන් අයකර ගත හැකි ය.

**පැහැර හැරීම සඳහා දණ්ඩනය.**

**19.** (1) ශ්‍රී ලංකාවේ වරායක සිට යම් ගමනාන්තයකට බඩු නැව්ගත කිරීම සඳහා නැව්ගතකරන්නකුගේ ඉල්ලීම පිට කාර්යාංශය විසින් නැව් ඉඩපහසුකම් හෝ මුහුදු යාත්‍රාවක නැව් බඩු ඉඩපහසුකම් වෙන්කරවා ගෙන, වෙන්කර තබා හෝ වෙන්කර දී ඇති හා කාර්යාංශයේ මතය අනුව, සාධාරණ හේතුවක් නොමැතිව එකී බඩු නැව්ගත කිරීමෙන් එකී නැව් ඉඩපහසුකම් හෝ නැව් බඩු ඉඩපහසුකම් මුළුමනින්ම හෝ ඉන් කොට සක් හෝ ප්‍රයෝජනයට ගැනීම එකී නැව්ගතකරන්නා පැහැර හරින අවස්ථාවක දී පුද්ගලිකව හෝ නියෝජිතයකු මාර්ගයෙන් හෝ කරුණු කියා සිටීමට එකී නැව්ගතකරන්නාට කාර්යාංශය විසින් අවස්ථාවක් ලබාදීමෙන් පසුව රුපියල් එක් දහසකට නොවැඩි දණ්ඩනයක් එකී නැව්ගතකරන්නාට නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කාර්යාංශය විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත්ව සිටින බඩු නැව්ගතකරන්නකුට, එම තීරණය තමා වෙත දන්වනු ලැබූ දිනට පසු දින දහයක් ඇතුළත එම තීරණයට විරුද්ධව අමාත්‍යවරයා වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින්, එකී අභියාචනය ඉදිරිපත් කරන ලද්දේ යම් තීරණයකට විරුද්ධව ද එකී තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම කළ හැකි ය.

(3) අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය ද (2) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඉඩ දී ඇති කාලසීමාව ඇතුළත එසේ කර නොමැති අවස්ථාවක කාර්යාංශයේ තීරණ ද අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර, අභියාචනයක් මාර්ගයෙන් හෝ රිට් ආඥාපත්‍රයක් මාර්ගයෙන් හෝ අන් කවර මාර්ගය කින් හෝ කිසිදු අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(4) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ දණ්ඩන මුදලක් වශයෙන් ගෙවන ලෙස නියම කරනු ලැබූ මුදලක් කාර්යාංශයට ගෙවීම නැව්ගතකරන්නකු ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින අවස්ථාවක දී, එකී නැව්ගතකරන්නාගේ අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත කාර්යාංශය විසින් ඉල්ලුම් කිරීමෙන් පසු, එකී මුදල එකී අධිකරණය විසින් සිය සාමාන්‍ය බලතල ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලබන දඩ මුදලකට වැඩි වුව ද එය නොතකා, එකී අධිකරණය විසින් පනවන දඩයක ආකාරයෙන් කාර්යාංශය විසින් එකී මුදල ඔහුගෙන් අයකර ගත හැකි ය.

(5) (4) වන උපවගන්තිය අනුව ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට මහෙස්ත්‍රාත්වරයකුට එකී දණ්ඩනයේ නිවැරදි භාවය හෝ න්‍යායානුකූල භාවය සලකා බැලීමට හෝ පරීක්ෂාකර බැලීමට හෝ තීරණය කිරීමට නියම කෙරෙන ලෙස හෝ බලය පැවරෙන ලෙස එකී උපවගන්තියේ කිසිවක් තේරුම් නොගත යුතු ය.

වන්දි ගෙවීම.

**20.** (1) ශ්‍රී ලංකාවේ වරායක සිට ගමනාන්තයකට බඩු නැව්ගත කිරීමේ දී, නැව්ගතකරන්නකු සඳහා කාර්යාංශය විසින් වෙන්කරවා ගත්, වෙන්කර තබා ගත් හෝ වෙන්කර දී ඇති නැව් ඉඩපහසුකම් හෝ මුහුදු යාත්‍රාවක නැව් බඩු ඉඩපහසුකම් මුළුමනින් ම හෝ ඉන් කොටසක් හෝ ප්‍රයෝජනයට ගැනීමට එම නැව්ගතකරන්නාගේ නොසැලකිල්ල හෝ පැහැර හැරීම හෝ හේතුකොටගෙන අලාභ වශයෙන් හෝ වෙනත් ආකාරයක යම් මුදලක් එම යාත්‍රාවේ අයිතිකරුට ගෙවන ලෙස කාර්යාංශයට නියම කරනු ලැබුව හොත්, එකී මුදල කාර්යාංශය විසින් ගෙවා ඇති බවට එකී යාත්‍රාවේ අයිතිකරු විසින් හෝ අයිතිකරු වෙනුවෙන් මුදල ලැබුණු බවට දෙන ලද යථා පරිදි සහතික කරන ලිපියක් කාර්යාංශය විසින් ඉදිරිපත් කරනු ලැබූ විට, එම නැව්ගතකරන්නාගෙන් එකී මුදල සම්පූර්ණයෙන් ම වන්දි වශයෙන් ලැබීමට කාර්යාංශයට හිමිකම් ඇත්තේ ය.

(2) ගෙවීම කරන ලෙස කාර්යාංශය විසින් ඉල්ලනු ලැබීමෙන් පසු දින තිහක කාලසීමාවක් ඇතුළත, (1) වන උපවගන්තිය යටතේ වන්දි වශයෙන් ගෙවීමට යටත් මුදලක් කාර්යාංශයට ගෙවීම පැහැර හරින හෝ නොසලකා හරින නැව්ගතකරන්නෙක් මේ පනත යටතේ වරදකරුවෙක් වන්නේ ය.

ලංකා නැව් ඉඩපහසුකම් කාර්යාංශයේ දේපළ ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශය සතු කිරීම.

**21.** (1) නියමිත දින හා එදිනට පසුව, ලංකා නැව් ඉඩපහසුකම් කාර්යාංශයට අයත්ව එකී නැව් ඉඩපහසුකම් කාර්යාංශයේ නමින් නැත හොත් එකී නැව් ඉඩපහසුකම් කාර්යාංශය වෙනුවෙන් යම් තැනැත්තකු ගේ හෝ තැනැත්තන්ගේ නමින් හෝ නම්වලින් භාරයක් වශයෙන් එම කාර්යාංශය සතුව තිබෙන චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම දේපළ, මේ පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්

කිරීමේ මධ්‍ය කාර්යාංශය සතු විය යුතු අතර මෙයින් එසේ සතු කරනු ලැබේ; තව ද එකී චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම දේපළ මේ පනතේ කාර්යයන් සඳහා එකී නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශය විසින් දැරිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ලංකා නැව් ඉඩපහසුකම් කාර්යාංශයේ නියමිත දිනයෙහි පවත්නා සියලුම ණය හා වගකීම්, මේ පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශය විසින් ගෙවනු ලැබිය යුතු අතර එම දිනයෙහි එකී කාර්යාංශ යට ලැබිය යුතුව ඇත්තා වූ සියලුම ණය හා ගෙවිය යුතුව ඇත්තා වූ සියලුම ග්‍රාහක මුදල්, දායක මුදල් හා දණ්ඩන වශයෙන් ගෙවිය යුතු සියලු මුදල් එකී ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශයට ගෙවනු ලැබිය යුතු ය.

**22.** ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ගමනාන්තයකට බඩු ගෙනයාම සඳහා මුහුදු යාත්‍රාවක නැව් ඉඩපහසුකම් හෝ නැව් බඩු ඉඩපහසුකම් වෙන්කර තැබීමේ පරම අයිතිය කාර්යාංශය සතුකර තිබීම හේතුකොටගෙන යම් තැනැත්තකුට කෙළින්ම හෝ අන් අයුරකින් හෝ සිදු වූ යම් පාඩුවක් සඳහා වන්දි ලැබීමට හිමිකම් නැත්තේ ය.

ඉඩකඩ වෙන්කර තැබීම සඳහා වූ පරම අයිතිය කාර්යාංශය වෙත සතු කිරීමේ හේතුවෙන් සිදුවනපාඩු උදෙසා වන්දි නොගෙවිය යුතු බව.

**23.** (1) 1971 අංක 38 දරන මුදල් පනතෙහි II වන කොටසෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව කාර්යාංශයේ මුදල් පාලනයට හා ගණන් හිලව්වලට අදාළ වන්නේ ය.

(2) කාර්යාංශයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය.

1971 අංක 38 දරන මුදල් පනතෙහි II වන කොටසෙහි විධිවිධාන අදාළවීම සහ කාර්යාංශයේ මුදල් වර්ෂය.

**24.** (1) (අ) කාර්යාංශයේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ නිලධරයන් හා සේවකයන් පත් කිරීමට ද;

(ආ) කාර්යාංශයේ කවර නිලධරයකු හෝ සේවකයකු හෝ පිළිබඳව විනය පාලනය ක්‍රියාවේ යෙදවීමට සහ සේවයෙන් පහ කිරීමට ද

කාර්යාංශයට බලය ඇත්තේ ය.

(2) කාර්යාංශයේ නිලධරයන්ට හා සේවකයන්ට කාර්යාංශය තීරණය කරන ප්‍රමාණයන් අනුව පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

කාර්යාංශයේ නිලධරයන් හා සේවකයන් පත්කිරීම.

**25.** කාර්යාංශයේ සියලුම නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු ය.

කාර්යාංශයේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් වශයෙන් සැලකීම.

**26.** අල්ලස් පනතේ අර්ථානුකූලව කාර්යාංශය උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු අතර ඒ අනුව එම පනතේ විධිවිධාන අර්ථ නිරූපණය කළ යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව කාර්යාංශය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකීම.

කාර්යාංශයේ විධාන.

27. (1) මේ පනතෙහි ප්‍රතිපත්ති හා විධිවිධාන හෝ එය යටතේ සාදන ලද නියෝග ඉටු කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, ශ්‍රී ලංකාවෙන් බඩු නැව්ගතකරන්නකුට හෝ එසේ නැතහොත් ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතයකු වශයෙන් කටයුතු කරගෙන යන යම් තැනැත්තකුට හෝ මණ්ඩලයකට කාර්යාංශය විසින් විධාන නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ සියලුම තැනැත්තන් ඒ සෑම විධානයක් අනුව ක්‍රියා කළ යුතු ය.

(2) මේ පනත යටතේ කාර්යාංශය මගින් නිකුත් කරනු ලබන යම් නියම කඩ කරන්නා වූ හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අසමත් වන්නා වූ යම් තැනැත්තෙක් වරදකරුවෙක් වන්නේ ය.

මේ පනත යටතේ කරන ලද්ද වූ හෝ කාර්යාංශයේ නියමය පරිදි කරන ලද්ද වූ කටයුතු සඳහා ආරක්ෂාව.

28. (1) (අ) කාර්යාංශය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද්ද වූ හෝ සද්භාවයෙන් කළ බව අදහස් කෙරෙන යම් කිසි ක්‍රියාවක් සම්බන්ධයෙන් කාර්යාංශයට විරුද්ධ ව, හෝ

(ආ) කාර්යාංශයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු හෝ විසින් මේ පනත යටතේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පිට සද්භාවයෙන් කරන ලද්ද වූ හෝ සද්භාවයෙන් කළ බව අදහස් කෙරෙන යම් කිසි ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

සිවිල් හෝ අපරාධ නඩු පැවරීම කළ නොහැකි වන්නේය.

(2) කාර්යාංශය විසින් හෝ කාර්යාංශයට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියට පමුණුවන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී කාර්යාංශය විසින් දරන ලද යම් වියදමක් කාර්යාංශයේ මුදල්වලින් ගෙවිය යුතු අතර එසේ පමුණුවන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී කාර්යාංශය වෙත ගෙවන ලද හෝ කාර්යාංශය විසින් අයකරගනු ලැබූ යම් ගාස්තු කාර්යාංශයේ මුදල්වලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් කිසි තැනැත්තකු විසින් මෙම පනත යටතේ හෝ කාර්යාංශයේ නියමය පිට කර ඇත්තා වූ හෝ කළ බව අදහස් කෙරෙන යම් කිසි ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියට පමුණුවන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන ලද කිසියම් වියදමක්, එම ක්‍රියාව ඉටුකර ඇත්තේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරයි නම්, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ වියදම ඔහු විසින් අයකරගනු නොලැබුවහොත් කාර්යාංශයේ මුදල්වලින් ඒ වියදම ගෙවිය යුතු ය.

නියෝග.

29. (1) මෙම පනතෙහි ප්‍රතිපත්ති සහ විධිවිධාන ඉටු කිරීමේ හා ක්‍රියාත්මක කරවීමේ කාර්යයන් සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකළ යුතු අතර එය එසේ පළකරනු ලබන දිනයෙහි දී හෝ නියෝගයෙහි නියම කරන ලද දිනයක දී හෝ ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මනින් ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ එම නියෝගය ඉදිරිපත් කිරීමෙන් පසු එක් මාසයක කාලසීමාවක් ඇතුළත එය අවලංගු කළ යුතු යයි ජාතික රාජ්‍ය සභාව තීරණය කරයි නම් එවිට එම නියෝගයෙහි වලංගු භාවය අවසන් විය යුතු අතර ඒ යටතේ ඊට පෙර කරන ලද යම් දෙයක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතු ය. එසේ අවලංගු නොකරන ලද යම් නියෝගයක් ජාතික රාජ්‍ය සභාව මගින් අනුමත වූවා සේ සැලකිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ජාතික රාජ්‍ය සභාවෙන් අනුමත වූවාක් සේ සලකනු ලැබූ විට, එය මෙහි ලා පනවනු ලැබූ ලෙස වලංගු හා ක්‍රියාත්මක විය යුතු ය.

(5) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකරුවෙක් වන්නේ ය.

30. මෙම පනත යටතේ වරදකරුවකු වන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට එක් අවුරුද්දකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම හා දඩය යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය. — වැරදි යනාදිය.

31. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද මෙම පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, මෙම පනතේ විධිවිධාන හා එවැනි වෙන යම් නීතියක විධිවිධාන හා අතර ගැටීමක් හෝ අනනුකූලතාවක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන බල පැවැත් වෙන්නේ ය. — වෙන යම් ලිඛිත නීතියක් හා ගැටීමක් ඇති වුව ද මෙම පනත බලපැවැත්වෙන බව.

32. (1) කාර්යාංශයේ යම් කිසි කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වුවහොත් එම යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයකින් අනුමත කරන්නා වූ අවස්ථාවක, එම දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සැලකිය යුතු අතර ඒ අනුව එය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන කාර්යාංශය වෙත පවරා දිය හැකි ය. — නිශ්චල දේපළ අත්කර ගැනීම.

(2) කාර්යාංශය වෙනුවෙන් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් කිසි දේපළක් අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු යම් මුදලක් කාර්යාංශයේ මුදල්වලින් ගෙවිය යුතු ය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— — අර්ථ නිරූපණය.

" ගිවිසුම් ගාස්තු ප්‍රමාණය " යන්නෙන් යම් අඩු ගාස්තු ප්‍රමාණයක් සඳහා නැව් අයිතිකරුවකුට අයත් නැව්වලින් ම පමණක් බඩු ගෙන යාමට නැව්ගතකරන්නකු එකඟ වූ ද මුහුදින් බඩු ගෙන යාම සම්බන්ධයෙන් ඒ නැව්ගතකරන්නා හා ඒ නැව් අයිතිකරු එකඟ වූ ද ඒ අඩු නැව් ගාස්තු ප්‍රමාණය අදහස් වේ;

" බඩු " යන්නෙන් කවර හෝ පන්තියකට හෝ විස්තරයකට අයත් බඩු, නිෂ්පාදන හා වෙළඳ ද්‍රව්‍ය අදහස් වේ;

" රාජ්‍ය සංස්ථාව " යන්නෙන් ණය හෝ ප්‍රදාන හෝ වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් සපයන ලද ප්‍රාග්ධනයෙන් සමාගම් ආඥා පනත නොවන ලිඛිත නීතියකින් හෝ නීතියක් යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

" ලංකා නැව් ඉඩපහසුකම් කාර්යාංශය " යන්නෙන් නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් අත්සන් කරනු ලැබ 1971 ඔක්තෝබර් 16 වන දින අංක එස්එච්/03/053 දරන ලිපියේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකා නැව්ගතකරන්නන්ගේ මණ්ඩලය විසින් 1971 නොවැම්බර් මාසයේ දී පිහිටුවන ලද සංවිධානය අදහස් වේ.